නිකවැරටිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස පැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ). සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආධාර රු.249,354 ක් ආදායම් හා වියදම් ගිණුමේ මූලධන ආධාර යටතේ අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). පළාත් පාලන අමාත්‍යාංශ ආධාර ලෙස සහා පෙර පාසලට ලැබී තිබුණු රු.19,590 ක උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). 2007 වර්ෂයේ සට පැවත එන කවුන්ටර් මේසයක්, විමසීම් මේසයක් හා රූපවාහිනී යන්ත්‍රයක් වටිනාකම ගණනය කර ලීබඩු හා උපකරණ යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 03 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.1,954,996 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.1,955,771 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතුව ගිණුම් ශේෂවල වටිනාකම රු.5,664,457 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.4,045,983 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.4,488,289 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.17,444,822 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආපායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,132 | 1,016 | 1,189 | 1,132 | 1,087 | 1,283 |
| (ii) | බදුකුලී | 6,160 | 6,944 | 773 | 5,663 | 6,762 | 964 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 775 | 758 | 17 | 850 | 715 | 17 |
| (iv) | වෙනත් ආදායම් | 28,995 | 27,039 | 12,978 | 29,371 | 27,258 | 14,620 |
| | එකතුව | 37,062 | 35,757 | 14,957 | 37,016 | 35,822 | 16,884 |

2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකල රු.5,102,783 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.7,875,281 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 සභා වත්කම් බදුදීම

සමාලෝචිත වර්ෂයට අදාලව වාර්ෂික ලංසු ක්‍රමයට බදුදීමට ලංසු කැඳවා තිබූ අවම ලංසුව රු.637,165 ක් වූ වත්කම් 11 ක් බදුදීමට නොහැකි වී තිබුණි.

2.2.5 වෙළඳ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 56 සිට 66 දක්වා ඇති පරිදි සභා බල ප්‍රදේශයේ පිහිටි වෙළඳාමක්, ව්‍යාපාරයක් , වෘත්තියක් සඳහා වූ බලපත්‍ර අදාල වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ලබාදිය යුතු වුවත්, එකී බලපත්‍ර ලබාදීමට අදාල ගැසට් නිවේදනය ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මැයි මස දක්වා ප්‍රමාද කර පලකර තිබුණි. එමෙන්ම 2009 වර්ෂයට අදාල රු.5,400 ක් වූ වෙළඳ බලපත්‍ර ගාසතුවක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම හිඟව පැවතුණි. විගණනයේදී සිදුකල සෝදිසි පරික්ෂාවට අනුව බල ප්‍රදේශයේ නොතාරිස් කාර්යාල 15 ක් පමණ පැවතියද එයින් බලපත්‍ර ලබාගෙන තිබුනේ එක් ආයතනයක් පමණි.

2.2.6 මස්කඩ හා පළතුරු කඩ හා තාවකාලික කඩ කාමර බදු

සභාවේ මස් කඩ 4 න් 3 ක් සඳහා ද පළතුරු කඩ 7 න් 1 ක් සඳහා පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. පළතුරු කඩ 7 කට අදාලව රු.25,860 ක් ලෙස මාසික වාරික 09 - 17 අතර හිඟයක් ද තාවකාලික කඩ කාමර 3 කට අදාලව රු.30,640 ක් ලෙස මාසික වාරික 4 - 13 අතර හිඟ ශේෂයක් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පැවතුණි.

2.2.7 පොදු වෙළඳපල කඩ කාමර බදු

මාසික වාරික 100 - 70 අතර එකතු වටිනාකම රු.153,483 ක් හිඟ පැවති නිකවැරටිය පොදු වෙළඳපල කඩ කාමර 3 ක් සමාලෝචිත වර්ෂය අගෝස්තු මාසයේදී සභාවට පවරාගෙන පැවතියද ඊට අදාල ඉදිරි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. දීර්ඝකාලීන බදුදීම් යටතේ පොදු වෙළඳපල කඩ කාමර 6 කට අදාලව රු.86,980 ක් ලෙස මාසික වාරික 15 - 20 අතර හිඟයක් පැවතුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 | අයවැයගත රු.000 | තථ්‍ය රු.000 | විචලනය රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 20,825 | 18,813 | 2,012 | 20,605 | 18,136 | 2,469 |
| අනෙකුත් | 13,593 | 12,456 | 1,137 | 13,415 | 11,328 | 2,087 |
| උප එකතුව | 34,418 | 31,269 | 3,149 | 34,020 | 29,464 | 4,556 |
| ප්‍රාග්ධන වියදම | 34,195 | 70,627 | (36,432) | 34,290 | 44,014 | (9,724) |
| මුළු එකතුව | 68,613 | 101,896 | (33,283) | 68,310 | 73,478 | (5,168) |

## 2.4 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| ද්විතියික | 26 | 20 |
| ප්‍රාථමික | 51 | 45 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 14 |

## 2.5 වත්කම් කළමණාකරණය

### 2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.14,984,094 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.5,289,964 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය

----------------------------

සේවා ස්ථාන මාරුවීම් වලට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට අයවීම හිඟ හිට තිබූ අවුරුදු 3 ට වැඩි කාලයකට අදාල සේවක ණය අත්තිකාරම් ශේෂය රු.2,701 ක් විය.

2.6 <u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

සභාවේ 2010 ඔක්තෝබර් 28 දින පැවති උත්සවයක් වෙනුවෙන් සභා අරමුදලින් වැයකර තිබූ රු.33,700 ක් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 (ඒ) ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගෙන් ලබාගත යුතු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව සතු නිකවැරටිය සතිපොල 1999 වර්ෂය සඳහා බදු ගැනිමට ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් පතක් විවෘත නොකරම සභාව විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අදාල ටෙන්ඩර් කරු විසින් සභාවට විරුද්ධව අධිකරණයේ නඩු පවරා තිබූ අතර, ඊට අදාල මහව දිසා අධිකරණයේ 2002 අප්‍රේල් 29 දිනැති නඩු තීන්දුව අනුව රු.80,000 ක අලාභයක් හා ඊට අදාල නඩු ගාස්තු ගෙවීමට තීරණය වී තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වාම එම මුදල ගෙවා නොතිබූ අතර, 2010 සැප්තැම්බර් 07 දින පැවති මහා සභා රැස්වීමේ තීරණය අනුව අදාල මුළු මුදල ලෙස රු.114,247 ක් අදාල පැමිණිලිකාර පාර්ශවයට ගෙවීමට තීරණය වී තිබුණි.

(ආ). සභාව වෙත ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා 2006 වර්ෂයේදී ඊට අදාල ගෙවිය යුතු වන්දි මුදල් ලෙස රු.50,000 ක් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද ඉඩම අත්පත් කර ගැනීම හෝ මාර්ගය ඉදිකිරීමත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුවී නොතිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(I) සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශෙෂය රු. 3,445,078 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසික වාරිකය ලෙස රු. 9,082 බැගින් එකී අරමුදල විසින් අය කර පැවතියද, එකී අය කිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැණුවත් වී නොතිබුණි.

(II) පිළිසරු ව්‍යාපෘතිය යටතේ, සමාලෝචිත වර්ෂයේ මැයි මාසය තුල රු.60,000 ක් වැයකර කොම්පෝස්ට් බැරල් 50 ක් මිළදී ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එයින් බැරල් 45 ක් බෙදාහැර නොතිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය
-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ). ආදායම් පාලනය

(ඈ) වත්කම් කළමණාකරණය